# කුඩා කණ්ඩායම් මගින් රබර් වගාවේ සිදු කළ හැකි ව්‍යාප්ති සේවාවේ නියාමක කාර්යභාර්ය

යූ.එල්.ආර්.ඒ. පෙරේරා

## හැදින්වීම

ශ්‍රී ලංකාවේ වාර්ෂික රබර් නිෂ්පාදනය වර්ෂ 2015 වන විට මෙට්‍රික් ටොන් 150,000/- ක් දක්වා වර්ධනය විය යුතුව ඇත. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා අළුතින් රබර් වගා කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පවති. නමුත් නිසි තාක්ෂණ ක්‍රමවේද යොදා නොගැනීම නිසා බහුතර ප්‍රමාණයක් වන කුඩා රබර් හිමියන්ගේ වාර්ෂික රබර් නිෂ්පාදනය හෙක්ටයාරයකින් (ගස් 500 කින්) කිලෝ ග්‍රෑම් 1200 කට සීමා වීම කණගාටුදායක කරුණකි. මෙම නිෂ්පාදනය වසරකට කිලෝ ග්‍රෑම් 2500 දක්වා වර්ධනය කරගත යුතුව ඇත්තේ ඉහත සඳහන් ඉලක්කය සපුරා ගැනීම සඳහාය. එය දේශීය රබර් නිෂ්පාදනයට මහත් සහනයක් වනු ඇත.

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය හඳුන්වා දී ඇති නවීන තාක්ෂණික ක්‍රමවේද උපයෝගි කරගන්නේ නම් ඉහත ඉලක්කය සපුරා ගැනීම පහසු දෙයකි. වැසි ආවරණ යොදා වසර පුරා කිරි කැපීම, උත්තේජක යොදා කිරි ගැනීම, පොහොර නිර්දේශිත පරිදි යෙදීම වැනි ක්‍රමවේද අනුගමනය කරමින් එම ඉලක්ක සපුරා ගන්නා වතු සමාගම් උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

කුඩා ඉඩම් හිමියන් නවීන තාක්ෂණය යොදා ගැනීමට දක්වන උනන්දුව වර්ධනය කිරීම සඳහා කුඩා කණ්ඩායම් මගින් රබර් වගාවේ යෙදෙන කුඩා රබර් ඉඩම් හිමියන් ඒකරාශිකර රබර් ව්‍යාප්ති නිළධාරී මගින් නිරන්තරව ලබා දෙන්නා වූ දැනුම, ආකල්ප, කුසලතාවයන් මගින් ඔවුන්ව තාක්ෂණය පිළිබඳවූ දැනුම් සම්භාර්ය කෙරෙහි පූර්ණ විශ්වාසයක් ඇති කරවීමත්, පරමාදර්ශ ඉඩම් (Model holdings) හැකිතාක් බිහිකිරීමට සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය යොදා ගත හැකිය. රබර් වගාවේ අපරිණත වසර පහක කාලය තුල නිර්දේශිත වර්ධනය ලබාගෙන නිවැරදි කිරි කැපුම් තාක්ෂණ, පරිණත වගාවට පොහොර භාවිතය යන ක්‍රමවේද ගැන ඇති කරන්නාවූ විශ්වාසය තුල, වසර පුරාම නිරන්තර ආදායම් ලබා ගැනීමට ඉඩම් හිමියාට හැකිවනු ඇත. එය ඔවුන්ගේ ආර්ථික සංවර්ධනයටත් රටේ ආර්ථික වර්ධනයටත් රබර් නිෂ්පාදනයටත් මහත් යහපත් වනු ඇත. මෙය ඔවුන් සවි බලගැන්වීමක් වේ. ආචාර්ය පොන්නයියා විග්නරාජා විසින් රචිත සහභාගිත්ව සංවර්ධනය (Participatory development) යන ග්‍රන්ථ අනුසාරයෙන් එම ලිපියේ සඳහන් කරුණු කාගේත් අවධානයට ලක්විය යුතුය.

පසුගිය දශක කිහිපය තුල ආසියා අප්‍රිකා සහ ලතින් ඇමෙරිකානු රටවල සංවර්ධන වේදීන්ගේ ප්‍රධාන මාතෘකාව වූයේ සංවර්ධනය යනු කුමක්ද? සංවර්ධනය කා සඳහාද? යන මෙම ප්‍රශ්න වලට සම්ප්‍රදායික දෘෂ්ටි කෝණයෙන් තොරව නූතන ප්‍රවේශයන් කෙරේ අවධානය යොමු කිරීම අතිශය වැදගත් ලක්ෂණයන් විය. දළ ජාතික ආදායම වර්ධනය වීම ඒක පුද්ගල ආදායම වර්ධනය වීම යන සංවර්ධන මානයන් නිර්නායකයන් වශයෙන් භාවිතා කිරීම වෙනුවට නව සංවර්ධන මාන නිර්නායකයන් කෙරෙහි අවධානය යොමු වන ප්‍රවේශයක් දක්නට ලැබේ.

**සංවර්ධන මානයන් ලෙස මානව සංවර්ධනය**

සංවර්ධනය පිළිබඳ සම්ප්‍රදායික මිණුම් දඬු ලාභය පෙරදැරි කොට ගැනීම ප්‍රචලිත ලක්ෂණයන් විය. එහෙත් එමගින් යථාර්ථ සංවර්ධනය නිරූපණය නොවන බව ජගත් සංවිධානය පවා පිළිගෙන තිබේ. මිනිසුන්ගේ සුභසාධනය සහ ඔවුන් සතු විභව ශක්තිය කෙරේ අවධානය යොමුකොට සංවර්ධන මානයන් නිර්නය කිරීමේ පරිශ්‍රමයක් ලෙසට මානව සංවර්ධන දර්ශකය (Human Development Index) හැඳින්විය හැකිය මෙවැනි සංවර්ධන මානයන් නිර්ණායක වශයෙන් තෝරා ගැනීම කෙරේ පොළඹවනු ලැබුයේ සම්ප්‍රදායික නිර්ණායකයන් තුල පැවැති නොගැඹුරු බවය සංවර්ධනයේ හේතුව මෙන්ම ඵලය වන්නේද මිනිසාමය. වෙනත් වචන වලින් කියනවා නම් සංවර්ධනය ඇති කරන්නේ මිනිසුන් මගින් වන අතර සංවර්ධනයේ අර්ථලාභින් වන්නේද මිනිසාමය. මානව සංස්කෘතික සමාජ ක්‍රමය විනාශ වන කවර හෝ භෞතික සංවර්ධන ප්‍රවේශයකට පැවැත්මක් නොමැත. මානව සංවර්ධන දර්ශකය මගින් පිළිඹු වන ප්‍රධාන ලක්ෂණ 4 ක් ඇත. එනම්,

ජීවන අපේක්ෂාව (Life expectancy), සාක්ෂරතාවය (Literacy) විනය ගරුක බව (Discipline) සහ ක්‍රය ශක්තියයි (Purchasing power).

මෙවන් සංවර්ධන පදනම්වල මූලික හරය වන්නේ සමාජයට හිතකර සංවර්ධනයන් ගොඩනැංවීමය.

**තිරසාර සංවර්ධනය (Sustainable development)**

සංවර්ධනයේ තිරසාර බව නැතහොත් අනාගත පැවැත්ම රඳා පවතින්නේ එය පවත්නා සමාජ ආර්ථික හා භෞතික පරිසරය වර්තමානයේ විනාශ නොකරන්නේනම් පමණි. මානව පැවැත්මට අනාගත අභිවෘද්ධියට අහිතකර වන සංවර්ධනයේ තිරසාර බවක් නොමැත. අද පවත්නා සංවර්ධනයේ ඇතැම් අංග නිසා එය මානවයාගේ පැවැත්මට අහිතකර වී ඇත. එබැවින් විසි එක්වන ශතවර්ෂයේ මහත් අභියෝගය වන්නේ තිරසාර සංවර්ධනයක් ඇති කරගත හැක්කේ කෙසේද යන්නය. තිරසාර සංවර්ධනයේදී පහත සඳහන් සාරධර්ම කෙරේ අවම වශයෙන් අවධානය යොමු කළ යුතු බව ආචාර්ය පොන්නයියා විග්නරාජා තම සහභාගිත්ව සංවර්ධනය යන ග්‍රන්ථයේදී අවධාරණයෙන් ප්‍රකාශ කරයි.

- දේශපාලන, සාමාජික හා සංස්කෘතික සමාන අයිතීන්
- සම්පත් භාවිතයේදී හා එයට ප්‍රවේශ වීමේදී සමාන අයිතීන්
- දේශපාලනික, සමාජ සේවා සහ සමාජමය කටයුතු වලදී තීරණ ගැනීමේ සහභාගිත්වය
- භෞතික හා මානව ශ්‍රමයේ අභිමානය සහ සමානත්වය
- තාක්ෂණික කටයුතු වලදී දැනුම් සම්භාරය කෙරේ විශ්වාසය තැබීම

මෙවන් තිරසාර සංවර්ධන ප්‍රවේශයක ආර්ථලාභින්ගේ සහභාගිත්වය සහ මැදිහත්වීම අතිශය වැදගත්ය.

**සහභාගිත්ව සංවර්ධන (Participatory development)**

සංවර්ධන ක්‍රියාදාමයේ සම්ප්‍රදායික ප්‍රවේශය වෙනුවට උපයෝගී කර ගැනීමට අපේක්ෂිත නව ප්‍රවේශයක් වශයෙන් සහභාගිත්ව සංවර්ධනය සඳහන් කළ හැකිය. සංවර්ධනයේ අවසාන අපේක්ෂාව වන්නේ ආර්ථ ලාභීන්ගේ ප්‍රගමනය නම් අවසාන ඉලක්කය වන්නේද මානව සංවර්ධනයයි. එවන් අවස්ථාවක එය තීරණය කළ යුත්තේ සංවර්ධනයේ අර්ථ ලාභීන්ගේ පරිසමය. උත්තරීතර ප්‍රභූ පක්ෂයේ බාහිර මැදිහත්වීම් මත කෙරෙන පිටස්තර තීරණයන් වෙනුවට විකල්ප සංවර්ධන ප්‍රවේශයක් ලෙස සහභාගිත්ව සංවර්ධනය සඳහන් කළ හැකිය. සහභාගිත්ව සංවර්ධනය පිළිබඳව අප්හෝප් (Uphoff) ප්‍රකාශ කරන්නේ මෙලෙසය.

"පුද්ගල කණ්ඩායම් ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ස්වයං උද්දීපනය මත කරනු ලබන එකතු වීමකි"

"ප්‍රජා සාමාජිකයන්ගේ හිතසුව පිණිස සහ සේවය සඳහා නව නිර්මාණයන් කිරීම හා ඊට දායක වීම සහභාගිත්ව සංවර්ධනයි"

සහභාගිත්ව සංවර්ධන පිළිබඳව ඉදිරිපත් කරන ලද මෙම නිර්වචනයන් දෙකෙන්ම ගම්‍යවන අරුත වන්නේ සෑම පුද්ගලයෙකුටම දැනුම හා කුසලතාවයන් ඇත යන්නය. එය පදනම් කරගෙන ශුභවාදී වෙනසක් ඇති කිරීමට මිනිසුන්ට අවස්ථාව දිය යුතුයි. මිනිසුන් තුල ඇතිවන ප්‍රශ්න ගැන අවබෝධයක් ඇත්තේ ඔවුන්ටමය. මිනිසුන්ගේ ප්‍රශ්න බාහිර පුද්ගලයන් මගින් හඳුනා, ගෙන බාහිර මිනිසුන් මගින් විසඳීමට වැයම් කිරීම කෘත්‍රිම ප්‍රවේශයකි. සහභාගිත්ව සංවර්ධනයේදී පහත සඳහන් ක්‍රියාදාමයේ අයිතමයන් සෑම දෙයකටම දායක වන්නේ අර්ථලාභීන්මය.

1. සැලසුම් කිරීම - Mapping out
2. පරමාදර්ශයන් ගොඩ නැංවීම - Make models
3. ක්‍රියාත්මක කිරීම - Implementing
4. ප්‍රමුඛතාවය තීරණය කිරීම - Ranking
5. නිරීක්ෂණය කිරීම - Observing
6. විග්‍රහ කිරීම - Analysing
7. මෙහෙයවීම - Monitoring
8. ඇගයීම - Evaluating

මෙවන් වාතාවරණයක් යටතේ සංවිධානය පුද්ගලයන්ගේය යන විශ්වාසයන් සහ හැඟීමත් ඔවුන් තුළ ඇතිවේ. මිනිසුන්ගේ අභිවෘද්ධිය සඳහා ආරම්භ කරන ව්‍යාපෘතියක් ඔවුන්ගේම දෙයක් බවට පරිවර්තනය වීමක් මෙයින් සිදුවේ. මෙයට ප්‍රධාන හේතුව වන්නේ දුප්පත් මිනිසුන් තුළ තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම කෙරේ විශ්වාසයන් ඇති වීමය. එහෙත් සමාජයේ පහත් ස්ථර මට්ටමින් සාකච්ඡාවන්

ආරම්භ කළ පමණින් හෝ රැස්වීම් තිබීමෙන්ම පමණක් සහභාගිත්ව සංවර්ධනයක් ඇති නොවේ. එවන් සහභාගිත්වයක් තුළ විවේචනාත්මකව එයට සහභාගිවීම හා ක්‍රියාත්මක කිරීමට සක්‍රියව දායකවීම අත්‍යවශ්‍යය. එම සක්‍රිය සහභාගිත්වය තුලින් පුද්ගලයන්ගේ ජිවන තත්වයේ සංවර්ධනයක් විය යුතුය.

සහභාගිත්ව සංවර්ධනය ප්‍රජාතන්ත්‍රවාදි සංකල්පයකි. එයින් පරිශ්‍රමය දරන්නේ සමානාත්මවාදි සමාජ ක්‍රමයක් ගොඩනැංවීමය. මේ අනුව සම්පත්වල සමානව ප්‍රවේශවීම, වෙනත් සෞඛ්‍ය හා අධ්‍යාපන කටයුතු වලට සහභාගිවීම හා මානව අවශ්‍යතා සැපිරීම නිරායාසයෙන් සිදුවන ක්‍රියාදාමයක් නොවේ. මේ සඳහා මිනිස් ක්‍රියාකාරකම් සජිවිකරණය කරන සජිවිකාරකයන් (Mobilizers) අවශ්‍යයයි. මොහුගේ කර්තව්‍යය ආරම්භකයෙකු හෝ නියාමකයෙකුගේ හෝ විපර්යකාරකයෙකුගේ (Initiator Animator or Change Agent) කාර්ය වේ. ඒ සඳහා විධිමත් සාම්ප්‍රදායික පුහුණු ක්‍රමයෙන් වෙනස් පුහුණුවක් අවශ්‍යයි. මෙය එය පුහුණුවන්නා කේන්ද්‍ර කොටගත් සහභාගි පුහුණු ප්‍රවේශයකි. ඒ අනුව නියාමකයාගේ කර්තව්‍ය වන්නේ පහත සඳහන් කටයුතු ක්‍රියාත්මක කිරීමය.

1. ගැටළුව විග්‍රහ කිරීම (Analyse the problem)
2. ගැටළුව අවබෝධ කර ගැනීම (Understand the problem)
3. අවශ්‍යතාවයන් එකට ගැලපීම (Articulate their needs)
4. පුද්ගලයන් ස්වයං ක්‍රියාකාරිත්වයට සංවිකරණය කිරීම (Mobilize people in to self reliance action)
5. සාමුහික ක්‍රියාකාරිත්වය (Collective action)

**නියාමකයන්/විපර්යකාරකයන් තේරීම**

සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයකදි නියාමකයන් හෝ විපර්යකාරකයන් තේරීම පහසු කාර්යක් නොවේ. නියාමකයන් තේරීම ඉතාමත් පරිස්සමෙන් කළ යුත්තකි. එවන් තේරීමකදි නියාමකයන් හඳුනා ගැනීම, තෝරා ගැනීම සහ සංවේදිකරණය සවිබලකරණය අත්‍යවශ්‍ය කරුණු වේ.

මෙම අංග වලින් සංවේදිකරණය නියාමක පුහුණුවක හරය වේ. එයද ස්වයං ඉගෙනුම් ක්‍රමයකි (Self Learning Process).

සංවේදිවූ නියාමකයෙකු තුල පහත සඳහන් ගුණාංග තිබිය යුතුය.

1. **නිරීක්ෂණය** (Observation)
2. විමර්ශනය (Investigation)
3. විවේචනය (Criticism)
4. ස්වයං විවේචනය (Self criticism)
5. කණ්ඩායම් හැසිරීම (Group behavior)
6. අත්දැකීම් හුවමාරුව (Exchanging experiences)

අධිරාජ්‍යවාදී පාලන ක්‍රම වලින් නිදහස් වූ රටවල් සංවර්ධනය සඳහා විවිධ මාදිලියේ ක්‍රම අනුගමනය කරන බව පෙනේ. සංවර්ධනයෙන් අපේක්ෂා කරන්නේ මානව සංවර්ධනය නම් එම රටට ආවේනික වූ සංස්කෘතිය. තාක්ෂණය, සාරධර්ම දැනුම් සම්භාරය විශ්වාසයන් මත පදනම් වීම අත්‍යවශ්‍ය වේ. එම සංවර්ධනය ආවේනික පරිසරය සමඟ සම්බන්ධවූවකි. සහභාගිත්ව සංවර්ධනයේ අපේක්ෂා කරන්නේ එවන් වාතාවරණයක් තුල පුද්ගල සහභාගිත්වය මත ඇති කරන වෙනසකි. මෙම ක්‍රමය සම්ප්‍රදායික සංවර්ධන ප්‍රවේශය වෙනුවට යොදාගත හැකි විකල්ප ක්‍රියාමාර්ගයකි. එය යථාර්ථයට (Alternative driving force) බද්ධ වී පවතින ක්‍රමයකි.

## ආශ්‍රිත ග්‍රන්ථ


අබේවර්ධන, විදුර (2005). කෘෂි ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් උදෙසා සහභාගිත්ව ගැමි පිවිසුම (PRA) හි ඇති වැදගත්කම. *රබර් පුවත්* **24**, 1-7.

Bulletin of the Rubber Research Institute of Sri Lanka (2005). **46**, Special issue.

පොන්නයියා විග්නරාජා - Participatory development පිළිබඳ වූ පොත.

ශ්‍රී ලංකා පදනම් ආයතනය - සහභාගිත්ව සංවර්ධන අත්පොත.